# JK පුවත්

2021/22 4 වන කාර්තුව | 2022 ජනවාරි, පෙබරවාරි සහ මාර්තු පුවත්


Pg 03



Pg 04


Pg 08


Pg 09

# සමූහාධිපතිතුමාගේ පණිවුඩය

## 2022 ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් සමූහාධිපතිතුමා නිකුත් කළ පණිවුඩයෙන් උපුටා ගැනීමක්



ක්‍රිෂාන් බාලේන්ද්‍ර
සභාපති

ඔබ දන්නා පරිදි, පසුගිය වසරේ ලෝක කාන්තා දිනයේදී අපි, 2025/26 කාලසීමාව වන විට අප සමූහයේ කාන්තා නියෝජනය 40% ක් දක්වා වර්ධනය කිරීමේ පස් අවුරුදු සැලසුමක් ප්‍රකාශයට පත්කළෙමු. මෙම ඉලක්කය ළඟා කරගැනීම සඳහා ONE JKH ව්‍යාපෘතිය හරහා වැඩසටහන් මාලාවක්ද ක්‍රියාවට නංවන ලදී. මෙම මැදිහත්වීම්, හැකියාවන් මත තනතුරු තීරණය කිරීම සහ සමානාත්මතාවට ප්‍රමුඛත්වය දීම සම්බන්ධයෙන් අප සමූහය දරන ස්ථාවරය යළි යළිත් තහවුරු කිරීමටත්, ජෝන් කීල්ස් සමූහයේ සේවය කරන කාන්තාවන්ට සමාන අවස්ථාවන් සහතික කිරීමටත්, අතීත දත්ත හා තහවුරු කරන ලද පර්යේෂණ ප්‍රතිඵල මත පදනම්ව ඔවුන්ට තම උපරිමය කරා ළඟා වීමට අත්වැලක් වීමට අවශ්‍ය පසුබිම සකස් කිරීමටත් දායක වනු ඇත.

සංචරණ සීමාවන් ලිහිල් කිරීමෙන් පසුවද තවමත් අඛණ්ඩව ක්‍රියාත්මක වන අපගේ සහනදායී හා සුචල්‍ය රැකියා විධිවිධාන නිසා, විශේෂයෙන්ම තම පවුලේ සාමාජිකයන් රැකබලා ගැනීම සිදුකරන සාමාජික සාමාජිකාවන් ඇතුළු සියලුම දෙනාට, තම කාලය වඩාත් හොඳින් කළමනාකරණය කරගනිමින්, වඩාත් ඵලදායී ලෙස කටයුතු කිරීමට අවස්ථාව ලැබී තිබේ. අපගේ කාර්ය මණ්ඩලයේ සේවය කරන, කුඩා දරුවන් සිටින දෙමාපියන් වෙනුවෙන් සහනදායී ගාස්තු යටතේ දිවා සුරැකුම් මධ්‍යස්ථාන සහ පෙරපාසල් පහසුකම් සපයා දීමට අපි පසුගිය ඔක්තෝබර් මාසයේදී පියවර ගත්තෙමු. අපගේ මාතෘ හා පීතෘ නිවාඩු කාලසීමාවන්, නීතියෙන් නියම කර ඇති කාලසීමාවන්ට වඩා දීර්ඝ වන අතර, දරුවන් දරුකමට හදා ගැනීමේ අවස්ථාවන් සඳහාද දැන් මෙම නිවාඩු විධිවිධාන අදාළ වේ. මාතෘ හා පීතෘ නිවාඩු ලබන සාමාජික සාමාජිකාවන් නැවත රැකියාවට පැමිණීම 100% මට්ටමේ රඳවා ගැනීම සඳහා අපි "Winning Over New Parents" නමින් නව ක්‍රමවේදයක් හඳුන්වා දුන්නෙමු.

අපගේ විවිධත්ව, සමානත්ව හා අන්තර්කරණ කණ්ඩායම මේ වනවිට අපගේ සමූහයේ සාමාජික සමාගම් වල සාම්ප්‍රදායික නොවන තනතුරු සඳහා කාන්තාවන් බඳවා ගැනීම සහ රඳවා ගැනීම සඳහා අදාළ සමාගම් සමග එක්ව කටයුතු කරමින් සිටින අතර, ඒ සම්බන්ධයෙන් දැනට වාර්තා වී ඇති ප්‍රතිඵල බෙහෙවින් සතුටුදායක ය.

නායකත්වයේ වගකීම්සහගත බව සම්බන්ධයෙන් ගත් විට, සැමට සමාන හා සාධාරණ ලෙස සලකනු ලබන සේවා ස්ථානයක් සහතික කිරීම සහ, වෙනස් කොට සලකනු ලැබීමට හා ස්ත්‍රී පුරුෂ භාවය සම්බන්ධ ගතානුගතික ආකල්ප වලට එරෙහිව ක්‍රියා කිරීම සඳහා අපගේ සමූහ විධායක කමිටුව සහ සමූහ මෙහෙයුම් කමිටුව පසුගිය වසරේදී 'Champions of Change' ප්‍රතිඥාව ලබාදුන්හ. 2021 ජූලි සහ අගෝස්තු මාස වලදී අපගේ සහකාර උප සමූහාධිපතිවරුන් සහ ඊට ඉහළ කළමනාකාරීත්වය, අචේතනික නැඹුරුතාවන් සම්බන්ධ ගැටලු හඳුනාගෙන ඒවාට විසඳුම් සෙවීමේ සංවාදයකට සහභාගී වූ අතර, මේ වනවිට ඔවුහු හෙළාදැකීමට හා ගතානුගතික ආකල්ප මත කටයුතු කිරීමට එරෙහි වීමටත්, අන්තර්කරණය තවදුරටත් ශක්තිමත් කිරීමටත් කැපවී සිටිති.

පසුගිය වසරට සාපේක්ෂව මෙම වසරේ අපගේ කාර්ය මණ්ඩලයේ කාන්තා නියෝජනය 1% කින් ඉහළ ගොස් තිබීම, අපගේ උත්සාහයන්ගේ මුල්ම ප්‍රතිඵල වලින් එකක් ලෙස හැඳින්විය හැකි වේ. මේ වනවිට අපගේ සමස්ත කාන්තා නියෝජනය 31% ක් වන අතර, අපට යාමට තවත් බොහෝ දුරක් ඉතිරිව ඇත. කාර්ය මණ්ඩලය තුළ සහ නායකත්ව තනතුරු වල මෙන්ම තීරණ ගැනීමේ සහ අධ්‍යක්ෂ මණ්ඩල මට්ටම් වල කාන්තා නියෝජනය වැඩි කිරීම, අප සමූහයේ පාරිසරික, සමාජයීය හා ආයතනික පාලන පැතිමානයන් තුළ ප්‍රමුඛත්වය හිමිවන කරුණක් බවට පත්වී තිබේ.

# සම්මාන සහ පිළිගැනීම්

TRANSPARENCY INTERNATIONAL
the global coalition against corruption

2022 පෙබරවාරි පළමුවන දින, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය විසින් සමාගම් ක්‍රියාවන්හි විනිවිදභාවය සඳහා උපරිම ලකුණු සංඛ්‍යාව හිමි කරගත් එකම සමාගම වූ ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස්, එම කාණ්ඩයේ පළමුවන ස්ථානය හිමිකරගැනීමට අඛණ්ඩව දෙවන වරටත් සමත් විය.



2022 පෙබරවාරි 15වන දින පැවතී EFFIE සම්මාන උළෙලේදී 2019 හි JKHMT ව්‍යාපෘතිය වන 'ද ඩීප් එන්ඩ්' , සන්නාම අත්දැකීම් (Brand Experience) අංශයේ අවසන් තරගකරුවන් හට හිමි සම්මානයෙන් පිදුම් ලැබීය.

2022 පෙබරවාරි 23වන දින පැවති සහතිකලත් වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමය (ACCA) විසින් සංවිධානය කල 2021 තිරසාර වාර්තාකරණ සම්මාන උළෙලේදී ජෝන් කීල්ස් හෝල්ඩින්ස් සමාගම, සමූහ සහ විවිධාංගීකරණය සඳහා වූ කාණ්ඩයේ අනුශූරතාව දිනා ගන්නා ලදී.



2022 පෙබරවාරි 8 වන දින, විකුණුම් කාර්ය මණ්ඩලයේ ප්‍රයත්නයන් සහ කාර්ය සාධනය ඇගයීමට සහ ප්‍රතිලාභ ලබා දෙන ශ්‍රී ලංකාවේ එකම උත්සවය වන SLIM NASCO (National Sales Congress) හිදී, සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස් හි කණ්ඩායම් සාමාජිකයින් 9 දෙනෙකු සම්මාන දිනාගන්නා ලදී.




2022 පෙබරවාරි 9 වන දින කීල්ස් විසින් SLIM සන්නාම විශිෂ්ටතා සම්මාන උළලේදී 'වසරේ සේවා සන්නාමය - 2021' සඳහා ලෝකඩ සම්මානය දිනාගත් අතර, 'අලෙවිකරණයේ හොඳම තාක්ෂණය භාවිතා කිරීම' සඳහා වන රිදී සම්මානය මෙන්ම 2022 ජනවාරි 25 වන දින, කොවිඩ් - 19 වසංගත තත්වයට නොසැලී මුහුණ දුන් ආයතන සඳහා පිදෙන සම්මානයේ අවසන් තරඟකරුවන් අතරටද පත් විය.







ජාතික ව්‍යාපාර විශිෂ්ටතා සම්මාන 2021 (NBEA) හිදී ප්‍රමුඛ සැපයුම් දාම විසඳුම් සපයන්නෙකු ලෙස ජෝන් කීල්ස් ලොජිස්ටික්ස් (JKLL) ප්‍රවාහන සහ සැපයුම් අංශයේ කුසලතා සම්මානයකින් පිදුම් ලැබීය. ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද මෙම උත්සවය 2022 මාර්තු 22 වන දින BMICH හිදී පැවැත්විණි.





2022 ජනවාරි 11 වන දින පැවති CMA Excellence විසින් සංවිධානය කරන ලද 2021 ඒකාබද්ධ වාර්තාකරණ සම්මාන උළලේදී සමස්ත අනුශූරතාව (රිදී කුසලානය) දිනාගැනීමට ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් සමත් විය. මීට අමතරව ජෝන් කීල්ස් සමූහය විශේෂ සම්මාන කාණ්ඩය යටතේ 'විශිෂ්ට ඒකාබද්ධ වාර්තා පහක්' සහ 'හොදම විවිධත්ව වාර්තාකරණය' ට හිමි සම්මානයන්ගෙන් ද පිදුම් ලැබීය.



2022 ජනවාරි 11 වන දින පැවති CMA Excellence විසින් සංවිධානය කරන ලද 2021 ඒකාබද්ධ වාර්තාකරණ සම්මාන උළලේදී, අඛණ්ඩ දෙවැනි වතාවටත් හොදම ඒකාබද්ධ වාර්තාකරණ 10 හිමි සම්මාන අතුරට යුනියන් ඇෂුවරන්ස් ඇතුලත් විය.




2022 මාර්තු 8වන දින යුනියන් ඇෂුවරන්ස් හි ප්‍රධාන බැංකු රක්ෂණ නිලධාරිනිය වන වින්ද්‍යා කුරේ, ආයතනික සහ වෘත්තීය කාණ්ඩය යටතේ වූ මූල්‍ය කළමනාකරණ අංශයේ වනිතාභිමානී සම්මානයෙන් පිදුම් ලැබිණි.

2022 මාර්තු 23 වන දින, ජෝන් කීල්ස් ලොජිස්ටික්ස් (JKLL), ශ්‍රී ලංකා ලොජිස්ටික් ෆ්‍රෙට් ෆෝවර්ඩ් සංගමය (SLFFA) විසින් සංවිධානය කරන ලද 2021 ජාතික සැපයුම් සම්මාන උළෙලේදී ගබඩා සහ බෙදා හැරීමේ කාණ්ඩයේ රිදී සම්මානය දිනාගන්නා ලදී.



2021 වසර තුළ ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝමේෂන් හි සේවය සහ ක්‍රියාකාරිත්වය අගය කිරීම සඳහා සැම්සුන්ග් හි නිරිතදිග ආසියාවෙහි සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී වන කෙන් කැන් විසින් 2022 මාර්තු 26 වන දින ජෝන් කීල්ස් සමූහයේ සභාපති වන ක්‍රිෂාන් බාලේන්ද්‍ර වෙත ගිනස් සම්මානය පිරිනැමීය.



## ජෝන් කීල්ස් සමූහය කොළඹ වීදි වෙළෙඳපොළක් ඉදිකිරීම සඳහා IFC සමග හවුල්කාරිත්වයක් ඇති කර ගන්නා ලදි.

ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් පීඑල්සී (JKH), කොළඹ වෙසෙන ජනතාවට වාණිජමය සහ තිරසාරමය ජීවනෝපායක් ලබා දීමට මෙන්ම නගරයේ සංචාරක කර්මාන්තය දියුණු කිරීමේ අරමුණ ඇතිව කොළඹ 02 හි වීදි වෙළෙඳපොළක් සංවර්ධනය කිරීම සඳහා 2022 මාර්තු 3 වෙනි දා ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව (IFC) සමග සහයෝගිතා ගිවිසුමකට එළැඹෙන ලදි. වීදි වෙළෙඳපොළ, ජෝන් කීල්ස් පදනමේ කොළඹ 02 ජෝන් කීල්ස් ප්‍රජා ශක්ති ව්‍යාපෘතිය යටතේ ඉදිරිපත් කළ සංකල්පයක් වන අතර ඒ සඳහා IFC, සිනමන් ලයිෆ් සහ යූනියන් ඇෂුවරන්ස් මෙන්ම නගර සංවර්ධන අධිකාරිය හවුල්කාරිත්වය දරයි.

ජෝන් කීල්ස් සමූහයේ සමූහාධිපති ක්‍රිෂාන් බාලේන්ද්‍ර මහතා JKH නියෝජනය කරමින් ගිවිසුමට අත්සන් තැබූ අතර IFC වෙනුවෙන් IFC හි ආසියානු සහ පැසිපික් කලාපීය උපසභාපති අල්ෆෝන්සෝ ග්‍රාසියා මෝරා මහතා අත්සන් තබන ලදි. නීති අංශයේ සභාපති, ලේකම් සහ CSR නදීජා තම්බියා, CSR අංශ ප්‍රධානී කාමලීන් ජයසූරිය සහ සිනමන් හොටෙල්ස් ඇන්ඩ් රිසෝට්ස් හි අලෙවිකරණ සහ ඉසව් උපසභාපති සහ ජෝන් කීල්ස් සමූහයේ ව්‍යාපාර කටයුතු ප්‍රධානී දිලීප් මුදදෙණිය යන මහත්මමහත්මීන් මෙම අත්සන් තැබීමට සහභාගී වන ලදි.





## "සිනමන් වැසි වනාත්තර ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය" දියත් කිරීම.

සිනමන් හොටෙල්ස් ඇන්ඩ් රිසෝට්ස්, ජොන් කීල්ස් පදනම විසින් "සිනමන් වැසි වනාත්තර ප්‍රතිසංස්කරණය" නමින් දියත් කර ඇති වන සංරක්ෂණ ව්‍යාපෘතිය සඳහා හවුල් වේ. රුක් රැකගන්නෝ (ශ්‍රී ලංකා රුක් සමාජය) සහ ශ්‍රී ලංකා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමග හවුල්ව දියත් කළ මෙම ව්‍යාපෘතිය යටතේ පළමු වසර තුන තුළ සිංහරාජ වන රක්ෂිතයට ආසන්න සුදුවැලිපොත ප්‍රදේශයේ විනාශ වූ හෙක්ටයාර් 20 ක භූමි ප්‍රමාණයක් ප්‍රතිසංස්කරණය කරන ලදි.

ස්වාභාවික වනාත්තර ප්‍රතිවර්ධනය කිරීම දේශගුණික විපර්යාස සඳහා ගෝලීය විසඳුමක් ලෙස හඳුනාගෙන ඇති අතර මෙම ව්‍යාපෘතිය, ව්‍යාපාරික ආයතනයක්, රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන සමග එක්ව ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම සඳහා ගත් කාලීන ආදර්ශයකි.

හවුල්කාරිත්ව ආයතනයන්හී ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් 2022 පෙබරවාරි 22 දින නාම පුවරුව විවෘත කිරීමෙන් පසුව තෝරා ගත් ප්‍රදේශයන්හී රුක් රෝපණය කිරීමෙන් මෙම ව්‍යාපෘතිය දියත් කරන ලදි. ඉන් අනතුරුව මාර්තු 08 වෙනිදා හවුල්කාරිත්ව ආයතනවල ප්‍රධාන පාර්ශවයන්ගේ සහභාගීත්වය ඇතිව කොළඹ සිනමන් ලේක්සයිඩ්හී මාධ්‍ය සාකච්ඡාවක් මෙහයවන ලදි. මෙම මාධ්‍ය සාකච්ඡාව තුළ JKH, CSR අංශ ප්‍රධානී කාමලීන් ජයසූරිය, සිනමන් නේචර් ට්‍රේල්ස්හී උපසභාපති චිත්‍රාල් ජයතිලක, සිනමන් හොටෙල්ස් ඇන්ඩ් රිසෝට්ස්හී නියෝජ්‍ය ප්‍රධාන විධායක නිලධාරී හිෂාන් සිංහවංශ, නියෝජ්‍ය වන සංරක්ෂක නිෂාන්ත එදිරිසිංහ සහ රුක් රැකගන්නෝ හී සභාපති දූෂී පෙරේරා යන මහත්මමහත්මීන්ගෙන් සැදුම්ලත් විද්වත් සාකච්ඡාවක් ඇතුළත් වුණු අතර ඔවුන් සිය අදහස් දක්වමින් මෙම ව්‍යාපෘතිය ව්‍යාපාරික ආයතනයක්, රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන සමග එක්ව ශ්‍රී ලංකාවේ ක්ෂය වේගෙන යන වන ගහනය සහ ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම සඳහා ගත් කාලෝචිත මෙන්ම ආදර්ශවත් ව්‍යාපෘතියක් ලෙස හඳුන්වාදෙන ලදි.








## පෙර සාමාන්‍ය පෙළ පාසල් ළමුන්ගේ ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය කිරීම

ජෝන් කීල්ස් පදනම විසින් ජෝන් කීල්ස් ඉංග්‍රීසි භාෂා ශිෂ්‍යත්ව වැඩසටහන (JKELSP) යටතේ ශ්‍රී ලංකාවේ තෝරා ගත් ජෝන් කීල්ස් ව්‍යාපාර ස්ථාන 20 ඇතුළත් කරගනිමින් 'English for Teens' වැඩසටහනේ පළමු අදියර 2022 පෙබරවාරි 11 වෙනි දා ආරම්භ කරන ලදි.

ඉංග්‍රීසි භාෂාව සහ තොරතුරු තාක්ෂණ කුසලතාවයන් වැඩිදියුණු කර ගැනීම තුළින් උසස් අධ්‍යාපනයට සහ රැකියාවන් සඳහා අවස්ථා වැඩි කර ගැනීමේ අරමුණ ඇතිව පැය 76 ක කාලයක් තුළ පවත්වන මෙම වැඩසටහන සඳහා දිස්ත්‍රික්ක 15 කින් සිසුන් 653 ලියාපදිංචි වන ලදි. ගේට්වේ භාෂා මධ්‍යස්ථානය මගින් පංති භෞතිකව සහ තාක්ෂණය හරහා දුරස්ථව මෙහෙයවයි.

සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස් (එලිෆන්ට් හවුස්), සිනමන් හොටෙල්ස්, ජේකේ මාර්කටින් සර්විසස්, කීල්ස් ෆුඩ් ප්‍රොඩක්ට්ස්, ජොන් කීල්ස් ලොජිස්ටික්ස්, ටී ස්මෝල්හෝල්ඩර් ෆැක්ටරීස්, වික්ටෝරියා ගෝල්ෆ් ක්ලබ් ඇන්ඩ් රිසෝට්ස් සහ යූනියන් ඇෂුවරන්ස් යන ජෝන් කීල්ස් සමූහ ව්‍යාපාර හා සම්බන්ධව JKELSP වැඩසටහන දියත් කරන ලද අතර අදාල ස්ථානයන්හී පැවැති සමාරම්භක උත්සවයන්හීදී JKF නියෝජනය කරමින් මෙම ආයතනවල සේවක මණ්ඩලය සහභාගී වන ලදි.





2022 මාර්තු 7 වෙනි දින ලැයිස්තුගත සමාගම්හී අධ්‍යක්ෂක මණ්ඩලය තුළ පක්ෂග්‍රාහීත්වය බිඳ දැමීම යන තේමාව යටතේ පැවති සාකච්ඡා මඬුල්ලේ සාමාජිකයෙකු ලෙස ජෝන් කීල්ස් සමූහයේ සමූහාධිපති ක්‍රිෂාන් බාලේන්ද්‍ර මහතා සහභාගී වන ලදි. 2022 ජාත්‍යන්තර කාන්තා දිනය සනිටුහන් කරමින් ලොව පුරා කොටස් හුවමාරු වෙළෙඳපොළවල් ශ්‍රම බලකාය තුළ කාන්තා සහභාගිත්වය වැඩිකිරීම තුළින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ඇති කිරීමෙහිලා හඬ අවදි කරන ලදි.




2022 මාර්තු 05 වෙනි දා සිළුමිණ පුවත්පතේ පළ වූ කාන්තා දින විශේෂ ලිපිය සඳහා ජෝන් කීල්ස් සමූහයේ සමූහාධිපති, නීතිමය ලේකම් සහ සමාජ සත්කාරක අංශ ප්‍රධානී - නදීජා තම්බයියා මහත්මිය, ජෝන් කීල්ස් සමූහයේ විධායක උප සමූහාධිපති සහ මූල්‍යමය සේවා අංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරි - ශෙරීන් කාදර් මහත්මිය, ජෝන් කීල්ස් සමූහයේ විධායක උප සමූහාධිපති, ආයතනික මූල්‍ය, බදු සහ සමාජ ව්‍යවසායිකත්ව අංශ ප්‍රධානී - නිස්රීන් රේමන්ජි මෙනවිය, ජෝන් කීල්ස් සමූහයේ විධායක උප සමූහාධිපති සහ ප්‍රවාහන, තොරතුරු තාක්ෂණය සහ වැවිලි සේවා අංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී - දේවිකා වීරසිංහ මහත්මිය සහ ජෝන් කීල්ස් සමූහයේ විධායක උප සමූහාධිපති සහ පාරිභෝගික ආහාර අංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරි - නෙලින්ද්‍රා ප්‍රනාන්දු මහත්මිය, පෙනී සිටින ලදී.


ජෝන් කීල්ස් දිනවන කාන්තා නියමුවෝ

වයාපාරික කාන්තාවන් වෙනුවෙන් 2022 මාර්තු 08 වෙනි දා පළවුණු LMD 'Essence' විශේෂ කලාපයේ සමූහයේ කාන්තා උපසභාපතිනියන් වන සිනමන් හොටෙල්ස් ඇන්ඩ් රිසෝට්ස් හි මානව මෙහෙයුම් කටයුතු උපසභාපතිනි - ඉෂාරා නවුෆාල්, ජෝන් කීල්ස් සමූහයේ උපසභාපතිනි සහ යූනියන් ඇෂුරන්ස්හි ප්‍රධාන මූල්‍ය නිලධාරිනි - ආශා පෙරේරා, ජෝන් කීල්ස් සමූහයේ උපසභාපතිනි සහ පාරිභෝගික ආහාර අංශයේ මානව සම්පත් ප්‍රධානී - නිසංසලා පරණයාපා, ජෝන් කීල්ස් සමූහයේ උපසභාපතිනි සහ කීල්ස් අලෙවිකරණ ප්‍රධානී - නිලූෂා ප්‍රනාන්දු, ජෝන් කීල්ස් සමූහයේ උපසභාපතිනි සහ ලංකා මරයින් සර්විසස් ප්‍රධාන විධායක නිලධාරිනි - අනුෂ්කා වීරරත්න, ජෝන් කීල්ස් සමූහයේ උපසභාපතිනි සහ ප්‍රධාන විධායක නිලධාරිනි නාලිකා අබේසූරිය යන මහත්මීන් පෙනීසිටින ලදි. කාන්තාවන්ට සිය සුවිශේෂී ශක්තීන් සහ ගුණාංග හරහා සැබෑ දක්ෂතාවයන් සහ හැකියාවන් හඳුනාගැනීමෙහිලා දිරිදීමට උපදේශකයින් සහ අනුග්‍රාහකයින් සිටීමේ වැදගත්කම පිළිබඳව කාන්තා නායිකාවන් කථා කරන ලදි.




සිනමන් හොටෙල්ස් ඇන්ඩ් රිසෝට්ස්හී 'EmpowHer' ජාලය, ජාත්‍යන්තර කාන්තා දිනය වන 2022 මාර්තු 08 වෙනි දා නගර හෝටල් සහ ප්‍රධාන කාර්යාලයේ සේවය කරන සියළුම කාන්තා සේවිකාවන්ගේ සහභාගිත්වය ඇතිව නිල වශයෙන් දියත් කරන ලදි. මෙම සමාරම්භක උත්සවය ශ්‍රී ලංකා සහ මාලදිවයින රිසෝට්ස්හී සියළුම කාන්තා සේවිකාවන්ට සජීවීව විකාශනය කරන ලද අතර ඉන්පසුව ඔවුන්ට අදාල ව්‍යාපාර ඒකකවලද මෙම ජාලය දියත් කරන ලදි.

'EmpowHer' ජාලය, සිනමන් හොටෙල්ස් ඇන්ඩ් රිසෝට්ස්හී කාන්තා සේවිකාවන්ට සහයෝගීත්වය සහ අදහස් හුවමාරුව තුළින් සියළුදෙනාම ඇතුළත් සවිබලගැන්වුණු සංස්කෘතියක් ගොඩනැගීම තුළින් අනෙකුත් කාන්තාවන්ට ද මෙම ක්ෂේත්‍රයට ඇතුළත් වීම සඳහා මගපෙන්වන ආදර්ශමත් චරිත බවට පත් වීමට අවස්ථාව සලසා දෙයි.









2022 ජාත්‍යන්තර කාන්තා දිනය මූලික කරගනිමින් ජෝන් කීල්ස් සමූහයෙහි දත්ත විශ්ලේෂණ අංශය වන OCTAVE, 2021 මාර්තු 26 වැනි දින සවස 6.00 සිට Microsoft Teams හරහා 'Women Leaders in Data Science' නමින් වෙබිනාර් සැසියක් පවත්වන ලදී. උසස් විශ්ලේෂණ වෘත්තිකයන්ට සහ උපාධි අපේක්ෂකයින්ට OCTAVE හි දේශක මඬුල්ලත් සමඟ ඔවුන්ගේ දැනුම සහ අත්දැකීම් බෙදා ගැනීමට අවස්ථාවක් හිමි විය.

දේශක මඬුල්ල : සුරංගි ගමගේ - ප්‍රධානී - ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය, හිරුණි කන්දවුඩආරච්චි - විශ්ලේෂණ බෙදාහැරීමේ කළමනාකරු, අසංග ගුණවර්ධන - ජ්‍යෙෂ්ඨ දත්ත විද්‍යාඥ, සහ දිනූෂා දිසානායක - දත්ත විද්‍යාඥ.


ප්‍රධාන දේශනය: නෙලින්ද්‍රා ප්‍රනාන්දු - විධායක උප සභාපති, ජෝන් කීල්ස් සමූහය සහ ප්‍රධාන මූල්‍ය නිලධාරී, පාරිභෝගික ආහාර අංශය

මෙහෙයවීම: නදීෂා ඒකනායක - ජ්‍යෙෂ්ඨ දත්ත විද්‍යාඥ















2022 මාර්තු 08 වන දින ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීම නිමිත්තෙන්, එම විශේෂ දිනය සංකේතවත් කිරීම සඳහා සියලුම කීල්ස් වෙළඳසැල් කණ්ඩායම් සාමාජිකයින් දම් පැහැති පටියක් පළඳින ලදී. වර්තමාන කීල්ස් ශ්‍රම බලකායෙන් 49% ක් දක්වා විවිධ භූමිකාවන්හි කාන්තාවන්ගෙන් සමන්විත වේ.කීල්ස් විසින් විවිධ භූමිකාවන් සඳහා කාන්තාවන්ට සහය ලබා දී ඇති අතර, ගොවිදිරි ව්‍යාපෘතිය හරහා සහාය ලබාදුන් ප්‍රදීපා සංජීවනී නම් තරුණ ගෙවිලිය සිට, කීල්ස් සඳහා දිගුකාලීන කුඩා මධ්‍ය පරිමාණ සැපයුම්කරුවෙකු වන රුෂිනි කුමාරි හට තම සන්නාමය සඳහා GMP සහතිකයක් මෙන්ම ISO22000 සහතිකයක් ද ලබා ගැනීමට උපකාරී වීම කදිම උදාහරණ වේ.














පාරිභෝගික ආහාර අංශය, කාන්තා දිනය සනිටුහන් කරමින් #BreakTheBias තේමාව යටතේ රචනා, කවි, චිත්‍ර සහ නිමැවුම් සහ ඡායාරූප යනාදී නිර්මාණ හරහා සේවකයින්ගේ අදහස් එළිදැක්වීමේ විශේෂ වැඩසටහනක් දියත් කරන ලදි.



නාරාහේන්පිට පිළිකා පූර්ව හදුනාගැනීමේ මධ්‍යස්ථානයේ ස්ථානභාර වෛද්‍ය නිලධාරී දුමින්ද විජේවර්ධන වෛද්‍යතුමාගේ සහභාගිත්වය ඇතිව CCS හී සියළුම කාන්තා සේවිකාවන් සඳහා පියයුරු පිළිකා පිළිබදව දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදි.

# oneJKH සමූහයේ විවිධත්වය, සාධාරණත්වය සහ අන්තර්කරණ ක්‍රියාකාරකම්


සේවායෝජකයාගේ සහාය ඇතිව ළමාරක්ෂණ වැඩසටහන තවතවත් ශක්තිමත් කරමින් ජෝන් කීල්ස් සමූහය 2022 පෙබරවාරි 25 වෙනි දා දෙවෙනි ළමා ආරක්ෂණ සේවා සපයන්නා ලෙස පොළිමත් විද්‍යාලය ඇතුළත් කර ගන්නා ලදි.



**රුවනි කරුණාරත්න**
වැටුප් සහ ප්‍රතිලාභ බෙදාහැරීම්-කළමනාකරු

"වසංගත තත්ත්වය සමග පසුගිය දෙවසර අතිශයෙන්ම අභියෝගාත්මක වූ අතර මගේ දියණිය කුඩා දරුවන්ගේ පූර්ව අධ්‍යාපනයේ වැදගත්ම අදියර වන දෙවෙනි වසර සම්පූර්ණ කරන ලදි. JKH විසින් සේවකයින් සඳහා විශේෂ ළමා ආරක්ෂක පහසුකම් දියත් කිරීම හරහා ඇය අන්තර්ජාලය හරහා පාඩම්වලට යොමුවීම මට වෘත්තීය සහ පෞද්ගලික වශයෙන් නිරවුල් මනසක් ඇති කළ අතර මහත් සහනයක් විය. මනාව සකස්කළ පාඩම් මෙහෙයවන කාරුණික ගුරුවරියන් සමග CeeBees අත්දැකීම ඇය ඉතාමත් ආදරයෙන් අත්විදින්නීය. ඇය පෙරපාසලේ පළමු මාසය ආරම්භ කළ අතර මගේ දියණියගේ සැබෑ දියුණුවක් දැකීමට මම බලාපොරොත්තු වෙමි."







එලිෆන්ට් හවුස් ශීතකළ රසකැවිලි කාන්තා සවිබලගැන්වීමේ වැඩසටහන වන 'දිනන්නී' හී අරමුණ වනුයේ දැනුවත් කිරීම තුළින් ශීතකළ රසකැවිලි ක්ෂේත්‍රය හා සම්බන්ධ වීමට හැකියාව සහ කැමැත්ත ඇති කාන්තාවන් දිරිමත් කිරීමය.

ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය වර්ධනය කිරීම සහ පක්ෂග්‍රාහීත්වය බිඳදැමීම සඳහා වූ කැපවීම තවතවත් වැඩි කරමින් එලිෆන්ට් හවුස් ශීතකළ රසකැවිලි අංශය 2022 මාර්තු 08 වෙනි දින ජාත්‍යන්තර කාන්තා දිනය සමරමින් BMICH හී පැවති ජාතික මට්ටමේ සවිබලගැන්වීමේ සහ සංවර්ධන වැඩසටහනක් සඳහා අනුග්‍රාහය දක්වන ලදි. මෙම වැඩසටහන කාන්තා සහ ළමා සංවර්ධන, පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතලපහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යංශය විසින් සංවිධානය කරන ලදි.

කාන්තා කණ්ඩායම් සාමාජිකයින් දිරිමත් කිරීම සහ දැනුවත් කිරීමේ අරමුණ ඇතිව දියත් කළ සමූහයේ කාන්තා කේන්ද්‍රීය අධ්‍යයන වැඩසටහන්වලින් එකක් වන WOICE හී තෙවෙනි අදියර 2022 පෙබරවාරි 24 වෙනි දා පවත්වන ලදි. WOICE වෙබ් දේශන හරහා වෘත්තීය වශයෙන් සහ පෞද්ගලිකව විශිෂ්ට මට්ටම් කරා ළගා වුණු කාන්තා නායිකාවන් පිළිබඳව කථා කරයි. මෙවර වැඩසටහනේදී LMD මුල් පිටුවේ පෙනී සිටි ප්‍රධාන වෘත්තීය කාන්තා සම්මාන 50 ඉලක්ක කරගත් වසරේ 'Trail Blazer' ලෙස පිළිගැනුණු හැටන් නැෂනල් බැංකුවේ සභාපතිනි අරුණි ගුණතිලක මහත්මියගේ අත්දැකීම් බෙදා ගැනීමට සහභාගීවූවන්ට අවස්ථාව ලැබුණි.






ජෝන් කීල්ස් සමූහයේ සියළුම කාන්තා කණ්ඩායම් සාමාජිකාවන් සඳහා 'Fems Aya' සනීපාරක්ෂක තුවා නොමිලේ ලබා දීම සඳහා ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් පීඑල්සී, 2022 මාර්තු 09 වෙනි දා හේමාස් මැනුෆැක්චරින් (පෞද්.) සමාගම සමග ගිවිසුමක් අත්සන් කරන ලදි. මෙම සමාගම් දෙක නියෝජනය කරමින් JKH සමූහාධිපති ක්‍රිෂාන් බාලේන්ද්‍ර මහතා සහ හේමාස් පාරිභෝගික සන්නාමනාම කළමනාකරණ අධ්‍යක්ෂක ශ්‍රියාන් ද සිල්වා විජේරත්න මහතා අත්සන් කරන ලදි.

ඔසප් සෞඛ්‍යය නිතර කථාබහට ලක් නොවන මාතෘකාවක් වන අතර ඒ පිළිබඳ අධ්‍යාපනය නොමැති කම සහ අත්‍යාවශ්‍ය සනීපාරක්ෂාව සඳහා පහසුකම් නොමැති වීම කාන්තාවන්ගේ ශාරීරික සහ මානසික සෞඛ්‍යයට පමණක් නොව ශ්‍රම බලකායේ කාන්තා ඵලදායීතාවය කෙරේ ද බලපෑම් ඇති කරයි. මෙම පහසුකම 'ONE JKH' වැඩසටහන යටතේ සමූහයේ විවිධත්වය, සමානාත්මතාවය සහ අන්තර්කරණය (DE&I) යන සංකල්පය හා සමගාමීව දියත් කරන ලදි.

# සමූහයේ පුවත්


## කොළඹ වරාය බටහිර බහාලුම් පර්යන්තය



කොළඹ වරාය බටහිර බහාලුම් පර්යන්තය (CWIT) හා ඉන්දියාවේ අදානි පෝට්ස් සහ විශේෂ ආර්ථික කලාප ආයතනය (APSEZ) සමඟ හවුල් ගිවිසුමක් අත්සන් කරනු ලැබූ අතර, ජෝන් කීල්ස් හෝල්ඩිංස් (JKH) සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය (SLPA) අතර ආයෝජන මණ්ඩලය (BOI) සමඟ ද ගිවිසුමක් අත්සන් කරන ලදී. 2022 පෙබරවාරි 10 වැනි දින ගොඩනැගීම, ක්‍රියාත්මක කිරීම සහ පැවරීම (BOT) පදනම මත කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ කොටසක් ලෙස කොළඹ වරාය බටහිර බහාලුම් පර්යන්තය සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාව ඇමෙරිකානු ඩොලර් මිලියන 650 (ආසන්න වශයෙන් රුපියල් බිලියන 130) ආයෝජනය කිරීමට නියමිතය.

## ජෝන් කීල්ස් ප්‍රොපටීස්

ප්ලාස්ටිසයිකල් හා සබැදි ජෝන් කීල්ස් ප්‍රෝපර්ටීස් (JKP), 2022 ජනවාරි 18 වන දින සිනමන් ලයිෆ් ඇතුළු එහි ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ප්ලාස්ටික් මොඩිෆයිඩ් ඇස්ෆෝල්ට් කොන්ක්‍රීට් (PMAC) භාවිතය සඳහා යොමු වීමට ඒ ජී සී ඉනොවෙට් පුද් සමාගම සමඟ හවුල් විය.








2022 ජනවාරි 15 වැනි දින ජෝන් කීල්ස් ප්‍රෝපර්ටීස් (JKP) සමාගම, සිය ට්‍රයිසෙන් (TRI-ZEN) ස්මාර්ට් නිවාසවල කුළුණු තුනෙහි ආකෘති කටයුතු නිම කිරීම, සුවිශේෂී උත්සවයක් මඟින් සමරන ලදී.

## සිනමන් හෝටෙල්ස් ඇන්ඩ් රිසෝර්ට්ස්








දශක ගණනාවක් පුරා ශ්‍රී ලංකාව 'සංචාරය කර යුතුම' ගමනාන්තයක් ලෙස විදහා දැක්වීම සඳහා සිය දායකත්වය දීමට පුරෝගාමී වූ සිනමන් හෝටෙල්ස් ඇන්ඩ් රිසෝර්ට්ස්, 2022 පෙබරවාරි 22වන දින 'වන් අයිලන්ඩ් තවුසන්ඩ් ට්‍රෂෙර්ස්' සංචාරක ප්‍රවර්ධන ව්‍යාපෘතිය දියත් කරන ලදී. ලෝකය ගවේෂණය කිරීමට උද්යෝගයෙන් බලාසිටින පිරිස සඳහා ශ්‍රී ලංකාවෙහි නොදත් පැතිකඩ,සංස්කෘතිකමය සහ පෞරාණික කථාවස්තූන් පිලිබඳ අපූරත්වයක් සහ උනන්දුවක් මැවීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි.


## සෙන්ටර් ෆන්ක්ෂන්ස්




2022 පෙබරවාරි 2 වන දින මධ්‍යස්ථාන මානව සම්පත් කණ්ඩායම, මොරටු විශ්ව විද්‍යාලය සමඟ එකමුතුව 'Are you Ready' වෘත්තීය ප්‍රදර්ශනය වෙබිනාර් සැසිය පවත්වන ලදී. මෙම සැසිය පෙබරවාරි 15, 17 සහ 18 යන දිනවලදී පැවැත්වුණු අතර විශ්වවිද්‍යාලයේ සිසුන් 200 කට අධික සංඛ්‍යාවක් සමඟ සාකච්ඡා පැවැත්වීමට හැකි විය. මෙහි ආරාධිත කථිකයා ලෙස ප්‍රොපටි ග්‍රෑප් හි ඉංජිනේරු ප්‍රධානී ලුම්බිණි පතිරගේ මහතා සහභාගී විය.



සමූහ පුහුණුවීම් සහ සංවර්ධන කණ්ඩායම විසින් ඕල් ස්ටාර්ස් - පුහුණු තරඟ සමඟින් හොඳම පුහුණුකරුවන් සහ දීප්තිමත්ම ඉදිරිපත් කරන්නන් සොයමින් ගිය ගමනෙහි අවසන් මහා තරගය වට, තුනකින් පසු 2022 පෙබරවාරි 17 වැනි දින අවසන් විය. මදුමාල් ගුණරත්න 'Train Games' උළෙලේ ජයග්‍රාහකයා වූ අතර මාර්ක් ගුණතිලක අනුශූරතාව හිමිකර ගත්තේය. 'Pitch Pros' ජයග්‍රාහකයා ලෙස ගිහාන් සමරවික්‍රම සමත් වූ අතර අනුශූරතාව ලශාන්තන් ගෝපාලන් විසින් හිමිකර ගන්නා ලදී.



## කීල්ස්

නවීන පන්නයේ ඉතා උසස් තාක්ෂණයෙන් සමන්විත, බෙදාහැරීමේ මධ්‍යස්ථානය 2022 මාර්තු මස 11 වැනි දින විවෘත කරන ලදී. අක්කර 9 පර්චස් 36 ක භූමි ප්‍රමාණයකින් සහ කණ්ඩායම් සාමාජිකයින් 580+ කට වඩා සමන්විත මෙම නව බෙදාහැරීමේ මධ්‍යස්ථානය කෙරවලපිටියේ පිහිටා ඇති අතර, ශ්‍රී ලංකාවේ නවීන සිල්ලර කර්මාන්තයේ විශාලතම සහ වඩාත්ම දියුණු ගබඩා පහසුකම් මධ්‍යස්ථානය මෙය වේ.












යොවුන් කුසලතා වර්ධනය සහ සිල්ලර වෙලදාම් කර්මාන්තය පිළිබඳව දැණුම තියනු කිරීම අරමුණු කරමින්, කීල්ස් සුපර්මාකට්ස් සහ කැළණි විශ්ව විද්‍යාලීය ව්‍යාපාර කළමනාකරණ පීඨය සමඟ 2022 පෙබරවාරි 17 වන දින හවුල් විය. මෙම හවුල්කාරිත්වය මගින් දේශීය විශ්ව විද්‍යාල සහ පුද්ගලික අංශය අතර බැදීම් ශක්තිමත් කරන අතර රැකියා අවස්ථා ලබා ගැනීමට ද අවස්ථාව සැලසේ.

## ජෝන් කීල්ස් ලොජිස්ටික්ස්

2022 ජනවාරි 1වන දා සිට 4වන දා දක්වා ජෝන් කීල්ස් ලොජිස්ටික්ස් හි අලුත් අවුරුදු සැමරුම ඉතාමත් උත්සවශ්‍රීයෙන් පැවැත්විණි.



## ජෝන් කීල්ස් පීඑල්සී









ප්‍රදේශයට ආවේනික වූ උසස් තත්වයේ තේ නිෂ්පාදනය කිරීමට ප්‍රසිද්ධ නාම ලත් ඌව හල්පවත්ත, හිඟල්ගොඩ, කෙනිල්වර්ත්, මත්තේකැලේ, නුවරඑළිය, වෙන්චර් සහ ග්ලෙනොර් තේ වතුකර හා නිෂ්පාදන කර්මාන්ත හි නිෂ්පාදිත තේ, 2022 පෙබරවාරි 5වනදා සිට 14වනදා දක්වා පවතී වෙන්දේසි කිරීම් වලදී වැඩිම මිලගණන් සඳහා අලෙවි වූ අතර ජෝන් කීල්ස් විසින් එම නිෂ්පාදනයන් හි වෙළදාම් සහ අලෙවි කටයුතු සිදු කරන ලදී.

## සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස්





2021 ජනවාරි 31 වන දින, සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස් පීඑල්සී හි ෂටල් රැකිං තාක්ෂණය සමඟින් සම්පූර්ණ බෝතල් ගබඩාව පුළුල් කිරීම, සමාගමේ වසර 156ක් වූ ඉතිහාසයේ සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. ජෝන් කීල්ස් සමූහ ව්‍යාපාරයේ සභාපති ක්‍රිෂාන් බාලේන්ද්‍ර, පාරිභෝගික ආහාර අංශයේ සභාපති දමින්ද ගම්ලත් සහ නායකත්ව කණ්ඩායම් සාමාජිකයින් එක්ව රණාල කර්මාන්තශාලා පරිශ්‍රයේ මෙම නව ගබඩාව නිල වශයෙන් විවෘත කරන ලදී.




පුද්ගල කළමනාකරණයේ වරලත් ආයතනයක් විසින් සංවිධානය කරනු ලැබූ "The Great HR Quiz 2022" හි ආහාරපාන වර්ග කාණ්ඩය යටතේ, ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් හි පාරිභෝගික ආහාර මානව සම්පත් කණ්ඩායම විශිෂ්ට ලෙස ජයග්‍රාහනය කරන ලදී. 2022 පෙබරවාරි 25 වන දින ගලදාරි හෝටල් පරිශ්‍රයේ පැවති උත්සවයේ CCS සහ KFP හි මානව සම්පත් කලමණාකාර කණ්ඩායම ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් නියෝජනය කළේය.

## ජෝන් කීල්ස් රිසර්ච්





2022 මාර්තු 15 වැනි දින ජෝන් කීල්ස් රිසර්ච් (JKR) 4Ever Skin Naturals (Pvt) Ltd සමඟ ප්‍රථම තාක්ෂණික බලපත්‍ර ගිවිසුමට එළැඹීය. JKR සතු රූපලාවන්‍ය වෙළඳ නාමය වන සිල්මෙටික් හි ප්‍රතිබැක්ටීරියාකාරක සම සුරැකුම් නිෂ්පාදන පෙළ 4Ever හරහා නිෂ්පාදනය සඳහා එකඟ විය.



'කර්මාන්ත 2022' ශ්‍රී ලංකාවේ කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරන ලද ප්‍රදර්ශනයට ජෝන් කීල්ස් පර්යේෂණ ආයතනය සහභාගී විය. 2022 පෙබරවාරි 3 සිට 6 දක්වා BMICH හිදී පැවති මෙම ප්‍රදර්ශනයේදී, ජලීය ග්‍රැෆීන් ඔක්සයිඩ් ද්‍රාවණයන් සංවර්ධනය කිරීමේ තාක්ෂණයක් ජෝන් කීල්ස් පර්යේෂණ ආයතනය ද ඉදිරිපත් කළේය.



## ජෝන් කීල්ස් IT






තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම සඳහා පුද්ගලික සහ රාජ්‍ය විශ්වවිද්‍යාල සමඟ එක්ව නව මුලපිරීමක් දියත් කරන ලදී. නිපුණතාවෙන් පරිපූර්ණ මෙම තරුණ පරම්පරාව සංවර්ධනය කිරීමේ සමාජ වගකීම ද භාර ගන්නා ලැබූ අතර ප්‍රධාන ව්‍යාපෘති ලෙස, 2022 මාර්තු 4 වන දින ආසියා පැසෙෆික් තොරතුරු තාක්ෂණික ආයතනය (APIIT) සමඟ අවබෝධතා ගිවිසුමක් (MOU) සහ 2022 මාර්තු 8 වන දින ESOFT Metro Campus සමඟ අත්සන් කරන ලදී. තොරතුරු තාක්ෂණ සිසුන් හට තම දැනුම පුළුල් කරගැනීමටත්, අනාගත නායකයින් වීමටත් මෙම F1 උපාධි වැඩසටහන මඟින් හැකියාව ඇත.


## ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝමේෂන්






JKOA - Samsung හවුල්කාර පාර්ශව රැස්වීම 2022 මාර්තු 6 සහ 7 යන දිනයන්හි Cinnamon Bey හිදී, JKOA හි ජංගම බෙදාහරින්නන්ගේ සහභාගිත්වයෙන් පැවැත්විණි. මෙම අවස්ථාවට Samsung හි Samsung Electronics කළමනාකාර අධ්‍යක්ෂ වන කෙවින් සන්ග්සු යු මහතා ද සහභාගී විය.

## යුනියන් ඇෂුවරන්ස්




2022 ජනවාරි 14 වැනි දින, ශ්‍රී ලංකාවේ ජීවිත රක්ෂණ ක්ෂේත්‍රයේ ඉතිහාසයේ Million Dollar Round Table (MDRT) තුළ වැඩිම සුදුසුකම් ලත් නියෝජිතයින් සංඛ්‍යාවක් බිහි කිරීමේ ඓතිහාසික ජයග්‍රහණය යුනියන් ඇෂුවරන්ස් විසින් හිමි කරගන්නා ලදී. 2020 සිට 74% ක ප්‍රතිශතයක වැඩිවීමක් පෙන්වමින් MDRT සුදුසුකම්ලාභින් 300දෙනෙකු මෙවර වාර්තා විය.






## JK පුවත් පසුගිය ප්‍රශ්නාවලියේ ජයග්‍රාහකයා

### සුජාන් කවින්ද

**පහත සඳහන් ප්‍රශ්න 6ට පිළිතුරු සපයා වටිනා තෑගී දිනාගන්න!**

ඔබ කළ යුත්තේ ජෝන් කීල්ස් පුවත් හි නවතම කලාපය මත පදනම් වූ සරල ප්‍රශ්න 5කට පිළිතුරු සැපයීමයි! 2022 මැයි 13 හෝ ඊට පෙර isuri.jkh@keells.com වෙත ඔබේ නම, BU සහ දුරකථන අංකය සමඟ ඔබේ පිළිතුරු එවන්න.

1. "සිනමන් වැසි වනාන්තර ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියේ" සහයෝගිතා පාර්ශව 2 නම් කරන්න.
2. කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා එලිෆන්ට් හවුස් ආයතනය විසින් හඳුන්වා දුන් වැඩසටහනේ නම කුමක්ද?
3. සිනමන් හෝටෙල්ස් ඇන්ඩ් රිසෝර්ට්ස් විසින් හඳුන්වා දුන් ගමනාන්ත ප්‍රවර්ධන ව්‍යාපාරයේ නම කුමක්ද?
4. නව කීල්ස් බෙදාහැරීමේ මධ්‍යස්ථානය පිහිටා ඇත්තේ කොහේද?
5. ජෝන් කීල්ස් රිසර්ච් හි හිමිකාර Silmetic™ තාක්ෂණය 4EVER Skin Naturals විසින් භාවිතා කරන්නේ කුමන අරමුණක් සඳහාද?

මෙම පුවත්පත ජෝන් කීල්ස් සමූහය තුළ බෙදාහැරීමට පමණි.
ඔබේ ප්‍රතිචාර යොමුකරන්න.

**ඉසුරි අබේවික්‍රම**
විධායක - සමූහ සන්නිවේදන අංශය
(Corporate Communications)

117 චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 2. දු.ක.: +94(0) 11 230 6191, වි.තැපැල්: jkh@keells.com වෙබ් අඩවිය: www.keells.com